# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

දුරකථනය / Telephone } +94 11 2758230

ෆැක්ස් / Fax }

මගේ අංකය / My Number } SE/08/2022/2023

ඔබේ අංකය / Your Number }

නුගේගොඩ,
ශ්‍රී ලංකාව.
NUGEGODA
SRI LANKA.

තැපැල් පෙට්ටිය - 6 - නුගේගොඩ.
POST OFFICE BOX - 6 - NUGEGODA.

Email : drasp@sjp.ac.lk
Web : www.sjp.ac.lk


2024.01.19

## විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රවේශය - 2022 / 2023 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා කළමනාකරණ පොදු/ විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති ගෞරව/ වාණිජවේදී ගෞරව/ විද්‍යාවේදී දේපල කළමනාකරණ හා තක්සේරුකරණ ගෞරව/ විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) ගෞරව උපාධි පාඨමාලාවන් හැදැරීමට ඔබව තෝරාගෙන ඇති බව සතුටින් දැනුම් දෙමි.

1. **අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට ලියාපදිංචි වීම**

**2024.01.19 දින සිට 2024.01.24 දින දක්වා අන්තර්ජාලය මගින් මාර්ගගත ක්‍රමයට විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වීම අනිවාර්ය වන බැවින් පහත සඳහන් කරුණු ඉතා හොඳින් අධ්‍යයනය කර එම පියවර අනුගමනය කරමින් 2024.01.24 දිනට පෙර අදාළ නිවැරදි උඩුගත කිරීම් සිදු කොට විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වන ලෙස කාරුණිකව දන්වා සිටිමි.**

i. විශ්වවිද්‍යාලයීය www.sjp.ac.lk වෙබ් අඩවිය වෙත පිවිස **"Student Enrolment"** තෝරන්න.

ii. **ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ උසස් පෙළ විභාග අංකය භාවිතා කර** මාර්ගගත ක්‍රමයට ශිෂ්‍ය ලියාපදිංචි වීමේ පද්ධතිය වෙත පිවිසෙන්න.

iii. පද්ධතිය වෙත පිවිසීමෙන් පසු ලබාදී ඇති ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීම සිදුකළ යුතු බැවින් ඒ සඳහා පහත පියවර අනුගමනය කළ යුතුය. (ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා පද්ධතිය වෙත පිවිසීමට පෙර පහත කරුණු ඉටු කර තිබීම වඩාත් යෝග්‍ය වන අතර **ඒවා පද්ධතිය වෙත අනිවාර්යයෙන්ම උඩුගත (upload) / ඇතුලත් කිරීම අත්‍යාවශ්‍ය වේ.)**

- **පාස්පෝට් ප්‍රමාණයේ (45mm උස x 35mm පළල) සුදු පසුබිමෙහි වර්ණ උඩුකය ඡායාරූපයක මෑදු පිටපතක් (මාස 06 කට වඩා පැරණි නොවන) (soft copy) ඡායාරූප ශාලාවකින් ලබාගෙන එය .jpg ආකෘතියෙන් උඩුගත කළ යුතුය. (උපරිම ධාරිතාව - 02 MB)**
(මේ සඳහා පරිලෝකනය (scan) කරන ලද , උඩුකය අපැහැදිලි , නළල, හිස හෝ කණ ආවරණය වන සේ ලබාගත් ඡායාරූප, සිනහවෙමින් හෝ ඇස් පිය වී ඇති , උපැස් යුවළ සහිත, ප්‍රමිතියෙන් තොර වර්ණ සහිත, අනුමත නොකරන මෙන්ම .jpg ආකෘතියෙන් තොර ඡායාරූප ඇතුළත් නොකළ යුතුය.)

- **ඔබගේ උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පතෙහි පැහැදිලි ඡායාපිටපත් සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සත්‍ය පිටපත් ලෙස සහතික කර, වෙන් වෙන් වශයෙන් පැහැදිලි pdf ආකෘතියේ වර්ණ පරිලෝකන පිටපත් (Scan) ලෙස උඩුගත කළ යුතුය. (උපරිම ධාරිතාව 02 MB)**
(අපැහැදිලි පරිලෝකන පිටපත්, ජංගම දුරකථන හෝ වෙනත් උපකරණ භාවිතයෙන් ලබාගත් ඡායාරූප ඇතුළත් නොකළ යුතුය.)

**(උප්පැන්න සහතිකය දෙමළ භාෂාවෙන් නම් එහි ඉංග්‍රීසි පරිවර්තනයක පිටපත ඉහත පරිදි pdf ආකෘතියට අනුව උඩුගත කළ යුතුය .) (උපරිම ධාරිතාව 02 MB)**

- නේවාසිකාගාර පහසුකම් / ශිෂ්‍යාධාර සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා පිවිස අදාළ තොරතුරු ඇතුළත් කළ යුතුය.ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් **011-2803471, 0112881731, 0112881732** දුරකතන අංක අමතන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

- මෙම ලිපිය සමග ලබා දී ඇති නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා නොකරන බවට ඇති ආකෘති පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එහි **වර්ණ පරිලෝකන (scan) පිටපත pdf ආකෘතියට අනුව උඩුගත කළ යුතුය.**
  **(උපරිම ධාරිතාව - 02 MB)**

iv. ඉහත ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමෙන් (Submit) අනතුරුව ඔබට මුදල් ගෙවීම සඳහා මුදල් ගෙවීමේ ආදර්ශ ආකෘති පත්‍රය ලබා ගත හැකිය.**පළමු අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් වීමේ ගාස්තුව වන රු.2,000/=** ක් එහි සඳහන් කිරීමෙන් ඔබට අනන්‍ය වූ බැංකු ගිණුම් අංකය සහිත ආදර්ශ ආකෘති පත්‍රයක් ලැබෙනු ඇත.මුදල් ගෙවීම සඳහා මහජන බැංකු ශාඛාවකින් මුදල් තැන්පත් කිරීමේ පත්‍රිකාවක් ලබාගෙන එය ඔබවෙත ලැබී ඇති ආදර්ශ බැංකු පත්‍රිකාවේ ආකෘතියේ සඳහන් පරිදි සම්පූර්ණකර **2024.01.24** දිනට පෙර රු.2,000/- මුදලින් ගෙවා අදාළ රිසිට්පත ලබාගන්න.

**ඉහත සඳහන් ලෙස සකස් කරගත් හා මාර්ගගත ක්‍රමයට ලියාපදිංචි වීමේ පද්ධතියට උඩුගත කළ (upload) ලිපිලේඛණ සුරැකිව ඔබ සතුව තබාගත යුතු අතර අවශ්‍යවන ඕනෑම අවස්ථාවක එම පිටපත් හා ඒවායේ මුල් පිටපත් විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.**

**2. විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය හැඳුනුම්පත සහ ශිෂ්‍ය වාර්තා පොත**

සියලුම සිසුන්ට විශ්වවිද්‍යාලයීය හැඳුනුම්පතක් සහ ශිෂ්‍ය වාර්තා පොතක් ඉදිරියේදී නිකුත්කරනු ලැබේ. **මේ සඳහා නිවැරදිව අදාල උඩුගත කිරීම් (Uploads) "Student Enrolment" වෙත සිදුකර තිබිය යුතුය.**

**3. විශ්වවිද්‍යාල ප්‍රවේශය කල් ගැනීම**

2022/2023 වසරට ලියාපදිංචි වූ එහෙත් අධ්‍යයන වැඩසටහනට සම්බන්ධවීමට නොහැකිවන සිසුන්ට වෛද්‍ය හෝ වෙනත් විශේෂිත හේතුමත අධ්‍යයන වර්ෂය දීර්ඝ කරගත හැක්කේ **එක් අධ්‍යයන වර්ෂයකින් පමණි.** එවැනි ඉල්ලීම් කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨයේ පීඨාධිපතිතුමා වෙත වෛද්‍ය සහ අනෙකුත් අදාළ ලිපි ලේඛණ සමග ඉදිරිපත් කළ යුතුය. **මෙම ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා ද ඔබ විශ්වවිද්‍යාලයේ අනිවාර්යයයෙන්ම ලියාපදිංචි වී තිබිය යුතුය.**

**4. පසුව ලියාපදිංචිය ලබාගැනීම**

නිසි පරිදි ලියාපදිංචි නොවූ හෝ නිසි පරිදි ප්‍රවේශය දීර්ඝ කරනු නොලැබූ සිසුන් පසුකාලීනව විශ්වවිද්‍යාලයට ඇතුලත්වීම සඳහා කරනු ලබන ඉල්ලීම් සළකා බලනු නොලැබේ. එම පුරප්පාඩු පිරවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබේ.

**5. ශිෂ්‍ය අත්පොත**

විශ්වවිද්‍යාලය පිළිබඳ සියලු විස්තර ඇතුළත් ශිෂ්‍ය අත්පොතේ **(Student Handbook)** සිංහල, **දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය පිටපත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.sjp.ac.lk/students)** බාගතකල හැකිය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

එස්.එන්.පළඟසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

දුරකථනය
Telephone } +94 11 2758230
ෆැක්ස්
Fax }
මගේ අංකය
My Number } SE/08/2022/2023
ඔබේ අංකය
Your Number }

නුගේගොඩ,
ශ්‍රී ලංකාව.
NUGEGODA
SRI LANKA.
තැපැල් පෙට්ටිය - 6 - නුගේගොඩ.
POST OFFICE BOX - 6 - NUGEGODA.

Email : drasp@sjp.ac.lk
Web : www.sjp.ac.lk


19.01.2024

## UNIVERSITY ENROLMENT OF STUDENTS - ACADEMIC YEAR 2022/2023

It is with great pleasure I inform you that you have been selected to the degree programmes, **Management Common/ Bachelor of Science Honours in Business Information Systems/ Bachelor of Commerce Honours/ Bachelor of Science Honours in Estate Management and Valuation/ Bachelor of Science Honours in Management (Public)** for the **academic year 2022/2023** in the **Faculty of Management Studies and Commerce of the University of Sri Jayewardenepura.**

1. Online Registration through internet

**You are required to register in the University through internet from 19.01.2024 to 24.01.2024**. It is compulsory to read and understand the following steps in completing the registration process and **need to register and upload the correct document before the 24.01.2024.**

i. Please visit the University website **www.sjp.ac.lk** and select **"Student Enrolment"**
ii. Use your **NIC number and Advance Level examination number** for login.
iii. After login you will have to complete the given application form. Follow the instruction carefully before submitting the application.

- **Please take a soft copy of passport size photograph (45 mm in height x 35mm in width) from a studio (white background with colour bust) and upload it. (jpg format soft copy) (Maximum Capacity – 02 MB )**

  (Scanned photographs, photographs taken with covering forehead, head and ears, photographs with spectacles, closed eyes, laughing, wearing cap, fade colours, photographs without jpg format etc. **will not be accepted**.)

- Certified clear copies **of your Birth Certificate and National Identity Card should be uploaded (Colour Scan .pdf format.) (Maximum Capacity – 02MB)**
  Note: - Copies of above documents should be certified **by a Justice of Peace (JP)** before upload from scan **.pdf** format.

- **English translation of the Birth Certificate should be uploaded (Only if the Birth Certificate is in Tamil Language – (Scan .pdf format) ) (Maximum Capacity – 02MB)**

- If you wish to apply for hostel facilities / Bursary, please enter the relevant information. **To obtain further the details please contact Student welfare Division (011-2803471, 011-2881731, 011-2881732)**

- Please fill out the declaration application form and upload a **colour scanned copy. ( pdf format.) (Maximum Capacity – 02 MB)**

iv. After filling the application you are able to receive a specimen bank slip for the payments. **Your registration fee for the first academic year is Rs. 2,000/=.When enter Rs. 2,000/=**, you will receive a bank account number which is unique to you. Please be good enough to do the payments in cash using the details in your specimen bank slip. Cash payments should be made to any branch of the peoples bank using a deposit slip and obtain a receipt **before 24.01.2024**

- **Please keep all uploaded and original documents you applied for the online registration in your possession. (To produce when necessary)**

**2. University Identity Card and Student's Record Book**

All students will be issued a University Identity Card and Student's Record Book in due course. For this, the relevant uploads must have been done correctly to the **"Student Enrolment".**

**3. Postponement of the University Entrance**

Registered students who are unable to join the academic programme 2022/2023 due to medical or other specific reasons can get the admission extended **only by one academic year**. Such applications should be submitted to Dean/ Faculty of Management Studies and Commerce , along with medical certificates and / or other relevant documents **only after admitting you as a student in the faculty.**

**4. Late Registration**

Students who have not been admitted on the due date or students, who haven't got their entrance duly extended, **will not be considered for late admissions** as steps will be taken by the University to fill such vacancies.

**5. Student Handbook**

The Student Handbook is an official document containing information about the University for students. Soft copy including Sinhala, Tamil and English languages **can be downloaded from University website. (www.sjp.ac.lk/students)**

Senior Assistant Registrar / Academic Student Affairs, Publications & Examinations Division
University of Sri Jayewardenepura
Gangodawila, Nugegoda,
Sri Lanka.

**S.N.Palangasinghe**
**Senior Assistant Registrar**
**Academic Student Affairs, Publications and Examinations Division**